# කොටි සමග සාකච්ඡා හා එක්සේසත් රාජ්‍යය

බ්‍රිතානිය නැවතත් සාම සාකච්ඡා තැටිය වාදනය කිරීමට පටන් ගෙන ඇත. ආබර් මහත්මිය තකහනියක් ලංකාවට පැමිණියේ සාකච්ඡා සඳහා ආණ්ඩුව තල්ලු කිරීමට ඊනියා මානව අයිතිවාසිකම් වාර්තාවක් සැපයීමේ අරමුණෙනි. ඇය කෙතරම් සාර්ථක වන්නේ ද යන්න තීරණය වන්නේ ආණ්ඩුවේ හා අනෙක් දේශපාලන පක්ෂවල ක්‍රියාකාරකම් මත ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය අමතමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කියා සිටියේ මානව අයිතිවාසිකම් ඉතා වැදගත් බවත් ඒ ඒ රටවල් තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ඒ යොදා නොගත යුතු බවත් ය. බටහිරයන් මානව අයිතිවාසිකම් කඩකිරීම් යොදාගන්නේ තමන් අකමැති රාජ්‍යයන්ට හා ප්‍රතිපත්තිවලට විරුද්ධව ය. තමන්ගේ රූකඩ ආණ්ඩුවලට එරෙහිව ඔවුහු කිසි දිනෙක මානව අයිතිවාසිකම් කඩකිරීම් යොදා නොගනිති.

බටහිරයෝ මානව අයිතිවාසිකම් කඩකෙළේ යැයි කියමින් තමන් අකමැති රාජ්‍යයන්ට එරෙහිව එක්කෝ ආර්ථික තහංචි පණවති ෂ නැතහොත් එක්සත් ජාතීන්ගේ හමුදා එවති. එහෙත් දෙවැන්න එතරම් ලෙහෙසියෙන් කළ හැක්කක් නො වෙයි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඒ සඳහා අවශ්‍ය වෙයි. ඒ අනුමැතිය ලබාගැනීම වළක්වනු වස් චීනය සමග ඇති සම්බන්ධකම් වර්ධනය කර ගත යුතු ය, මියන්මාරයේ හමුදා ආණ්ඩුවට විරුද්ධව චෝදනා තිබිය හැකි ය. එහෙත් මියන්මාරයට එරෙහිව බටහිරයන් නොයෙකුත් අඩත්තේට්ටම කරත්දී එරට විශාල ප්‍රමාණයකට ඒ හිරිහැරවලට මුහුණ දීමට සමත් වී සිටින්නේ චිනය මියන්මරයට යම් ආධාරයක් කිරීම නිසා ය. අද මියන්මාරයේ ජනතාව දුක්ගැහැටවලට මුහුණ දෙන්නේ නම් එයට ප්‍රධාන වරද කරුවකු වන්නේ බටහිර ය.

ආර්ථික තහංචි පැනවීමට හා ආධාර කපාදැමීම් වලට එරෙහිව ඊනියා දියුණුවෙමින් පවතින රටවල් හඬක් නැඟිය යුතු ය. බටහිරයන් එවැනි කප්පාදුවලින් දඬුවම් දෙන්නේ ඒ ඒ රටවල් එක්කෝ තමන් අකමැති ආණ්ඩුවක් ප්‍රජාතන්ත්‍රවාදීව පත්කරගැනීම හෝ තමන් අකමැති එතරම් ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආණ්ඩුවක් පෙරළා නොදැමීම හෝ පිළිබඳ ව ඒ ඒ රටවල ජනතාවට ය. බටහිරයන් කියන්නේ ආධාර දීමට නම් තමන් කැමති ආණ්ඩුවක් පත්කරගන්නා ලෙස ය. යමකු පුද්ගලයකුට හෝ රටකට හෝ ආධාර කළ යුත්තේ ඒ පුද්ගලයාට හෝ රටට හෝ ආධාර අවශ්‍ය යැයි සිතන බැවින් මිස වෙනත් අරමුණු ඇතිව නො වේ. ඒ ආධාර දේශපාලන කොන්දේසි විරහිත ව විය යුතු ය. ආධාරකිරීමට නම් තමන්ගේ බෙර පදයට නැටිය යුතු යැයි කියන්නා ආධාර (ණය) තම දේශපාලන අවශ්‍යතා උදෙසා යොදා ගනියි. එසේ කිරීම මනුෂ්‍යත්වයට එරෙහි වූ අපරාධයක් වෙයි. අනෙක් අතට ඉතිහාසය පුරා මානව අයිතිවාසිකම් පිළිබඳ ව බටහිරයන්ට ඇත්තේ ලේ නොතැවරුණු අත් නො වේ.

බටහිරයන් මොන ආර්ථික තහංචි පැනවුව ද අපි ඔවුනට යටත් නොවීමට තීරණය කරමු. මෙරට රාජ්‍ය නොවන දාසයන් දාහක් හමාරක් මානව අයිතිවාසිකම් හා ආර්ථික තහංචි පිළිබඳ ව තමන්ට ලැබෙන වැටුපට සරිලන ආකාරයෙන් කෑ ගසනු ඇත. එහෙත් අපි ඒ දාසයන්ට සවන් නො දෙමු. ජාතියේ සෙවරීභාවය විකුණන් කන දාසයන්ට සැලකිය යුත්තේ ඔවුන්ට සුදුසු අයුරින් ය. මිනිස් ඉතිහාසයේ විකාශයක් ගැන කතා කළ ද දාසයෝ මානසික වහල්ලු වෙති. මාක්ස්වාදීන් ද ඇතුළු මේ දාසයන්ට මේ භවයේ දී වහල්බවින් නිදහස්විය නො හැකි ය. පුනබ්භවයක් නැතැයි විශ්වාස කරන්නවුනට වහල්බවින් නිදහස්වීම ගැන  විශ්වාසයක් තබාගැනීමට ද අවකාශයක් නැත.

ලංකාණ්ඩුව අද නිරත වී සිටින්නේ මානුෂික මෙහෙයුමක ය. එහි ප්‍රධාන ඉලක්කය වනුයේ කොටි ත්‍රස්තවාදීන්ගෙන් අසරණ දෙමළ ජනයා මුදා ගැනීම ය. අප කලින් සඳහන්කර ඇති ආකාරයට එයට ආනන්ද සංගරී මහතාට විරුද්ධ විය නො හැකි ය. එපමණක් නො වේ. එයට බටහිරයන්ට ද විරුද්ධ විය නො හැකි ය. මානුෂික මෙහෙයුමකට පැසිද්ධියේ විරුද්ධවිය හැක්කේ කොටින්ට හා දෙමළ ජාතික සංධානයට පමණකි. එසේ නම් ඒ මෙහෙයුම් නතර කිරීමට යැයි ඒ කොටස් දෙකට හැරෙන්නට අනෙක් කිසිවකුට ප්‍රසිද්ධියේ කිවහැකි නො වේ. එසේ මෙහෙයුම් නැවැත්වීමට යැයි කියන්නකුට මානුෂික හැඟීම් තිබිය හැකි නො වේ. සමහර විට මානව හිතවාදය ගැන බයිලා කියන දාසයන්ට මානුෂික හැඟීම් නැතිවා විය හැකි ය. කොටි පැරදවීම දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්න සමග පටලවාගත යුතු නො වෙයි. කොටි සහ ඇතැම් දෙමළ දේශපාලන පක්ෂ හා කසිකබල් මාක්ස්වාදී පක්ෂ කතාකරන ඊනියා ප්‍රශ්නය කුමක් වුවත් අද දෙමළ ජනයාගෙන් කොටසකට හෝ ඇති ප්‍රධාන ම ප්‍රශ්නය කොටි ය. එබැවින් දෙමළ

© Prof. Nalin De Silva

ජනයාගේ පැත්තෙන් බැලූ විට ද අද කළ යුතු ප්‍රධාන ම කාර්යය කොටි පැරදවීම ය. කොටි සමග සාකච්ඡා ඇරඹිය යුතු යැයි කියන්නෝ උතුරු පළාතේ කොටි ගැහැටවලට මුහුණ දී සිටින දෙමළ ජනයාගේ විරුද්ධකරුවෝ ය. දාසයන් කියන්නාක් මෙන් ම උතුරු පළාතේ දෙමළ ජනතාව ද මෙරට පුරවැසියෝ වෙති. එසේ නම් ඒ පුරවැසියන් කොටින්ගෙන් මුදාගැනීමට දාසයන් විරුද්ධ වන්නේ ඔවුන්ගේ බටහිරට ඇති වහල්බව හේතුකොටගෙන විය යුතු ය.

ආණ්ඩුව නැවත නැවතත් අවධාරණය කළ යුත්තේ අද ඇත්තේ මානුෂික මෙහෙයුම් මිස හුදු කොටි සමග කෙරෙන සටනක් නොවන බව ය. සටනක් නැති තැන සටන් විරාමයක් ද තිබිය නො හැකි ය. සටන් විරාමයක් නැති තැන සටන් විරාම ගිවිසුමක් ද තිබිය නො හැකි ය. එ ජා ප විසින් අත්සන් කරන ලද ඊනියා සටන් විරාම ගිවිසුමට ඉතිහාසයේ කුණු කූඩයවත් හිමි නැත. ඒ ගිවිසුම සංශෝධනය කිරීමක් ගැන කතාවක් නො තිබිය යුතු ය. ඒ එවැනි ගිවිසුමක් තිබිය නොහැකි බැවිනි.

එසේ නම් දෙමළ ජනයාගේ ඊනියා අභිලාෂ සපුරාලිය හැක්කේ කෙසේ දැයි දාසයකු ප්‍රශ්න කිරීමට ඉඩ ඇත. මේ අභිලාෂ කතාව මෑතක දී එකතු වූවකි. එයට පෙර තිබුණේ දෙමළ ජනයාට එරෙහි අසාධාරණකම් ය. එහෙත් ඒ අසාධාරණකම් මොනවා දැයි කීමට දෙමළ පක්ෂ අසමත් විය. ඔවුන්ට කිවහැකි වූයේ ඇතැම් පෝරමයක් දෙමළ බසින් නැත ආදී කතා පමණ ය. එවැනි ප්‍රශ්න ඇත්නම් ඒ විසඳීම සඳහා සන්ධීය රාජ්‍යයක් අවශ්‍ය නො වේ. කළ යුත්තේ දෙමළ බසින් පෝරම ලබාගැනීමට සැලැස්වීම පමණ ය. මුළු මහත් සන්ධීය රාජ්‍ය කතාව ම බොරුව හා බොරුව පමණක් මත පදනම් වූවකි. පළමුව දෙමළ නායකයෝ දෙමළ ජනයාට ඇති අසාධාරණකම් ගැන කීහ. මේ ඊනියා අසාධාරණකම් යනු අන් කිසිවක් නොව බ්‍රිතානි පාලන සමයෙහි දෙමළ ප්‍රභූන්ට දුන් වරප්‍රසාද ඡන්ද බලය ලැබීමත් සමග අහෝසිවී යෑම ය. පාර්ලිමේන්තුව පිහිටුවීමෙන් පසුව තවදුරටත් මධ්‍යයෙහි තමන්ට කලින් තිබූ දේශපාලන බලය රැකගත නොහැකි බව දෙමළ නායකයන් අතරින් චෙල්වනායගම් මහතා තේරුම් ගත්තේ ය. ඔහු එවිට උතුරු හා නැගෙනහිර පළාත් එක්කර එහි දේශපාලන බලය ලබාගැනීම සඳහා, එනම් ඒ පළාත්වල වෙනම රාජ්‍යයක් බිහිකිරීම සඳහා, ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය නමින් පක්ෂයක් ගොඩනගාගත්තේ ය. ඒ සිදුවූයේ 1956 රාජ්‍ය භාෂා පණත සම්මතවීමට අවුරුදු හත අටකට කලින් බව ඊනියා ප්‍රශ්නයේ ආරම්භය පනස්හයට තල්ලුකිරීමට උත්සාහකරන අමන දාසයන්ගේ දැනගැනීම සඳහා කිව යුතු ය. තමාගේ දැන් ටිකක් පසුව ගොඩක් යන උපක්‍රමය ඔස්සේ දෙමළ රාජ්‍යය බිහිකිරීමේ පළමු පියවර ලෙස සන්ධීය රාජ්‍යයක් ලබාගැනීමට චෙල්වනායගම් මහතා කටයුතු කෙළේ ය. ඒ සඳහා ඔහු පළමුවෙන් ම සිංහලයන් රැවටීමට තම පක්ෂය ඉංගිරිසියෙන් ෆෙඩරල් යනුවෙන් නම් කෙළේ ය. ඉන්පසු එතෙක් උතුරේ දෙමළ ජනයාගේ අඩු සැලකිල්ලට ලක් ව සිටි නැගෙනහිර දෙමළ ජනයා ද මුස්ලිම් ජනයා ද කඳුකරයේ දෙමළ ජනයා ද තම ව්‍යාපාරයට එකතුකර ගැනීමට කටයුතු කෙළේ ය. උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම රාජ්‍යයක් පිහිටුවීම සඳහා ඒ පළාත්වලට බොරු ඉතිහාසයක් නිර්මාණයකිරීමේ කාර්යයට දෙමළ රාජ්‍ය පක්ෂය ඉන්පසු අතගැසුවේ ය. ඒ කෙළවර වූයේ ඊනියා නිජභූමි සංකල්පය නිර්මාණය කිරීමෙනි.

සන්ධීය රාජ්‍යයක බලය බෙදීමකට සිංහල බහුතරය එකඟ නොවනු ඇත්තේ මේ ඉතිහාසය හේතුකොරගෙන ය. දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නයක් විසඳීමට කොටි සමග සාකච්ඡාවලට හෝ සන්ධීය රාජ්‍යයක බලය බෙදීමට හෝ ඔවුහු විරුද්ධ වෙති. එහෙත් දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නයක් විසඳීම සඳහා නොව රටේ සංවර්ධනය උදෙසා ඒකීය රාජ්‍යයක ඇතැම් බලතල පළාත් සභාවලට, ප්‍රාදේශීය සභාවලට, ගම් සභාවලට දීමට සිංහල ජනයාගෙන් බහුතර පිරිස අකමැති නො වෙති. ඒ ඔවුනට නුහුරු දෙයක් නො වෙයි. ඇතැම් දේශපාලන විද්‍යාඥයන් නොදැන සිටිය ද මෙරට අවුරුදු දහස් ගණනක් තිබූ එක්සේසත් රාජ්‍යය යනු ඒකීය රාජ්‍ය විශේෂයකි. ඇතැමුන් සිතන්නේ ඒකීය රාජ්‍යය යනු බටහිර බිහිවූවක් ලෙස ය. බටහිරයන් ජාතික රාජ්‍යය ගැන සිතීමට අවුරුදු දහස් ගණනකට පෙර මෙරට එක්සේසත් ජාතික රාජ්‍යක් විය. එක්සේසත් රාජ්‍යයක් යනු ඊනියා එක්සත් රාජ්‍යයක් නො වේ. එක්සෙසත් රාජ්‍යයක් ස්වෛරී වන අතර එහි ස්වෛරී බලය ඇත්තේ මධ්‍යයෙහි ය. එයට අමතර ව තවත් බලතල රාශියක් මධ්‍යයෙහි වෙයි. එහෙත් ඇතැම් බලතල සංවර්ධනය හා ජනතාවගේ පහසුව සඳහා පරිධීය ඒකකවලට හිමිවෙයි. ඒ ඒකක රටේ නාමයෙන් එලෙස හිමි වී ඇති බලතල ක්‍රියාත්මක කරයි. අතීතයේ මෙරට විසූ ඈපාවරු මාපාවරු ආදීහු රජුගේ නාමයෙන් ප්‍රාන්තවල බලතල ක්‍රියාත්මක කෙරුවෝ වෙති. අපි අපේ ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගනිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva